පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව -සබරගමුව

සති පාසල

විෂය-පෙරදිග සංගීතය

ජුනි මාසය

ශ්‍රේණිය-9

4 - සතිය

Department of Education,Sabaragamuwa Province/ Weekly School

1.පාඩම හෝ ඒකකය- Sharps,Flat,Natural Marks

2.නිපුණතාවය 8.0 -සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විධි හඳුනාගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත් දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කර ගනියි.

3.නිපුණතා මට්ටම 8.1 - බටහිර සංගීත ප්‍රස්තාරකරණයේ කුසලතා ලබයි.

4.පෙර ඉගෙනුම් අවස්ථා/ශිෂ්‍යා කළ යුතු කාර්යයන් :

- ඔබ 8 ශ්‍රේණියේ දෙවන වාරයේ දී උගත් බටහිර සංගීතය ප්‍රස්තාර කරමු. යන පාඩම මතකයට නඟා ගන්න.
- බටහිර සංගීතය ප්‍රස්තාර කිරීම යන පාඩම මතක් කර ගැනීමට පහත link එක ඔස්සේ සම්බන්ධ වන්න.
  https://youtu.be/PO0l3-Pukbg?list=PLQX7SVzJRMEyWeForMF46PN133BmstojH
- ඔබ 9 ශ්‍රේණියට නියමිත Sharps,Flat,Natural Marks අධ්‍යයනය කර ගත හැකි පොත්පත්,Web Site , LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක පහත link ඔස්සේ නරඹන්න.
  - eනැණපියස :

    Interactive Lesson :
    https://www.enenapiyasa.lk/lms/mod/h5pactivity/view.php?id=12374
  - eතක්සලාව : -
  - Youtube :

1. https://youtu.be/VaNEPLch9v0

2. https://youtu.be/1y0nh_-TJlo?list=PLQX7SVzJRMEykqp1u1-SvbkxIRW-DAsER

අතිරේක පොත්/සඟරා :

1.අතිරේක කියවීම් පොත- පෙරදිග සංගීතය-9 ශ්‍රේණිය
2.සංගීත අධ්‍යයනය-ගුණපාල විතානගේ මහතා
3.ජානක බණ්ඩාර ජයලත් - පෙරදිග සංගීතය-9 ශ්‍රේණිය

❖ එසේ තාක්ෂණය ඔස්සේ නැරඹිය නොහැකි දරුවන් සඳහා මෙම බටහිර ස්වර සංකේත පිළිබඳ හැදෑරීමට කියවීම් පත්‍රිකාව උපයෝගී කර ගන්න.

<u>කියවීම් පත්‍රිකාව</u>

බටහිර සංගීතයේ දී ශුද්ධ,කෝමල සහ තීව්‍ර වශයෙන් වෙන් වෙන් වශයෙන් නම් කෙරේ.ඒවා Natural,Flat ,Sharp ආදී වශයෙන් නම් කෙරේ.

Flat Mark : පෙරදිග ක්‍රමයට කෝමල ස්වරයක් ලකුණු කිරීමේ දී ස්වරයට යටින් ඉරක් අඳිනු ලැබුවද,බටහිර සංගීතයේ දී ස්වරයට ඉදිරියෙන් බෝ කොළ අර්ධයක් ලෙස දැක්වෙන සංකේතයක් පහත දැක්වෙන පරිදි භාවිත කෙරේ.




Sharp Mark : පෙරදිග ක්‍රමයට තීව්‍ර ස්වරයක් ලකුණු කිරීමේ දී ස්වරයට පසු පසින් ඇල ඉරක් අඳිනු ලැබුවද,බටහිර සංගීතයේ දී ස්වරයට ඉදිරියෙන් කොටුවක් ලෙස දැක්වෙන සංකේතයක් පහත දැක්වෙන පරිදි භාවිත කෙරේ.




Natural Mark : Flat Mark : පෙරදිග ක්‍රමයට ශුද්ධ ස්වරයක් ලකුණු කිරීමේ දී ස්වරයට කිසිදු සංකේතයක් යොදනු නොලැබුවද,බටහිර සංගීතයේ දී ස්වරයට ඉදිරියෙන් පහත දැක්වෙන පරිදි සංකේතයක් භාවිත කෙරේ.



5.මෙම සතිය තුළ නියමිත පාඩම්වලින් ලබා ගත යුතු ඉගෙනුම් ඵල :

- බටහිර සංගීත ප්‍රස්තාරයක භාවිත වන සංකේත කිහිපයක් පැහැදිලි කරයි.
- එම සංකේත ලියා දක්වයි.
- බටහිර ක්‍රමයට ප්‍රස්තාර කිරීමේදී අවශ්‍යතාව පිළිගනියි.
- බටහිර ක්‍රමයට ප්‍රස්තාර කිරීමේ කුසලතාව ලබයි..

6.ඇගයීම්/තක්සේරුකරණ ක්‍රමවේද හා ආකෘති :

1.පහත දැක්වෙන පෙරදිග ස්වර කොටස් නියමිත සංකේත යොදා බටහිර ක්‍රමයට ප්‍රස්තාර කරන්න.

i. ස ස ස / රි රි රි / ග - රි / ස - -
ස ස ස / රි රි රි / ග - ග / ම - -
ම ම ම / ග ග ග / රි රි රි / ස - -
ස ස ස / ම - - / ම ග රි / ස - -

ii. ස ස රි රි / ග රි ස - / රි රි ම ම / ප - - -
ම ම ප ප / ධ ධ නි නි / ධ ධ ප ම / ප - - -
ප ප ස̇ ස̇ / නි ධ ප ම / ප - - - / නි ධ ප -
රි රි ග ග / ම ම ග රි / ස - - - / - - - -

Iii. ස රි ග / රි ග ම́ /ප ම́ ග /රි ස -
නි රි ග / ප ම́ ග /ම́ ග රි / ස - -

පාඩම සැකසුම : නිවිතිගල අධ්‍යාපන කලාපය

සෞන්දර්ය අංශය